# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

බෞද්ධ ආචාරධර්ම හා බෞද්ධ සමාජ දර්ශනය - **BUPH 28224**

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. 'ආචාර්ධර්ම' යන්න නිර්වචනය කොට බෞද්ධ ආචාරධර්මවල අරමුණු හා පරමාර්ථ කවරේ දැයි පෙන්වා දෙන්න.

02. ක්‍රියාවක හොඳ - නරක තීරණය කරන්නේ කුමන පදනමකින් දැයි බෞද්ධ සදාචාරාත්මක නිර්ණායක අනුසාරයෙන් විමර්ශනය කරන්න.

03. පුඤ්ඤ සහ කුසල යන පදවලින් නියෝජනය වන ආචාරධර්ම අතර වෙනසක් තිබේ දැයි කෙටියෙන් පැහැදිලි කොට සාංසාරික ප්‍රවෘත්තිය හා පින අතර සම්බන්ධය පෙන්වා දෙන්න.

04. සචේතනික ක්‍රියාවේ වගකීම දැරීමට ප්‍රමාණවත් නිදහසක් කර්තෘ වෙත තිබේ දැයි බෞද්ධ ආචාර ධර්ම නයින් විශද කරන්න.

05. බෞද්ධ සදාචාර මාර්ගයේ පරම පූර්ණතාව නිර්වාණාධිගමයෙන් ප්‍රකටවන අයුරු මූලාශ්‍රය අනුසාරයෙන් පෙන්වා දෙන්න.

06. බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිමට සාපේක්ෂව බුදුරදුන්ගේ සමාජ දාර්ශනික භූමිකාව ඇගයීමට ලක්කරන්න.

07. බෞද්ධ දේශපාලන මූලධර්ම පිළිබඳ මූලාශ්‍රයාගත සාධක ඇසුරෙන් විවරණයක් කරන්න.

08. අපරාධ මර්දනයෙහි ලා නීතිරීති හා දඬුවම්වල අවශ්‍යතාව කෙතෙක්දැයි බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් විශද කරන්න.

09. සමාජයක ප්‍රගතිය හුදෙක් ආර්ථික සාධක මත පදනම් නොවන බව බෞද්ධ සමාජ දර්ශනාගත ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.

10. වර්තමාන සමාජ ගැටලුවලට සාධනීය විසඳුම් සෙවීමේ දී බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය ඔබ කැමති සමාජ ගැටලුවක් අනුසාරයෙන් ඉදිරිපත් කරන්න.

*************************